# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2447/20 – 2025 ජූලි මස 29 වැනි අඟහරුවාදා – 2025.07.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 ඔක්තෝම්බර් මස 04 වැනි දින අංක 1830/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 299 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/115.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/MH/05.

2025 ජූලි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**1 වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 526බී, ගංගොඩවිල දකුණ B ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගංගොඩවිල (කොට්ඨාස අංක 25 - ගංගොඩවිල දකුණ, මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2025/13 හා 2025.04.08 අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම්:

**01. කැබලි අක්ෂර D – වෙදවසම් කොලයෙන්කුඹුර, මදටියගහකුඹුර සහ කඳුරුගහ කුඹුර සහ ඕවිට – ප්‍රමාණය:හෙක්. 0.0020**

උතුරට: මු. පි. කො 9583 හි කැබලි අංක 43 සහ ප්‍රවේශ මාර්ගය; නැගෙනහිරට: මු. පි. කො 9583 හි කැබලි අංක 43, ප්‍රවේශ මාර්ගය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර E; දකුණට: කැබලි අක්ෂර E; බටහිරට: කැබලි අක්ෂර E.

**02. කැබලි අක්ෂර E – වෙදවසම් කොලයෙන්කුඹුර, මදටියගහකුඹුර සහ කඳුරුගහ කුඹුර සහ ඕවිට – ප්‍රමාණය:හෙක්. 0.0627**

උතුරට:කැබලි අක්ෂර C, මු. පි. කො 9583 හි කැබලි අංක 43, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර D, ප්‍රවේශ මාර්ගය සහ එච්. එල්. ඒ. පෙරේරා හිමිකම් කියන වනාත පාරේ වරිපනම් අංක 59/8 B දරන ඉඩම; නැගෙනහිරට: මු. පි. කො 9583 හි කැබලි අංක 43, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර D, ප්‍රවේශ මාර්ගය සහ එච්. එල්. ඒ. පෙරේරා හිමිකම් කියන වනාත පාරේ වරිපනම් අංක 59/8 B දරන ඉඩම, මු. පි. කො 9583 හි කැබලි අංක 50 සහ 49; දකුණට: මු. පි. කො 9583 හි කැබලි අංක 49 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B, A,

මු. පි. කො 9583 හි කැබලි අංක 42, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර C මු. පි. කො 9583 හි කැබලි අංක 43, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර D සහ ප්‍රවේශ මාර්ගය.

EOG 07 – 0347

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1830/51 හා 2013.10.04 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, 2013 අංක 299 හා 2013.09.30 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. පහත විස්තර වන එම ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1830/51 හා 2013.10.04 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2013 අංක 299 හා 2013.09.30 වැනි දින දරන ආඥාව මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල සම්බන්ධයෙන් පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/115.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/MH/05.

2025 ජූලි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**1 වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 526B, ගංගොඩවිල දකුණ B ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගංගොඩවිල (කොට්ඨාස අංක 25 - ගංගොඩවිල දකුණ මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2025/12 හා 2025.04.08 දිනති අනුරේඛනයේහි පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර A – අඹගහකුඹුර සහ ඉහලවෙලේකුඹුර – ප්‍රමාණය:හෙක්. 0.0845**

උතුරට: එස්. එස්. ඒ. තිලකසිරි හිමිකම් කියන රබර්වත්ත පාරේ වරිපනම් අංකය සොයාගත නොහැකි ඉඩම සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට: කැබලි අක්ෂර B, මු. පි. කො 9583 හි කැබලි අංක 40 සහ කළුආරච්චිගේ කමලාවතී හිමිකම් කියන රබර්වත්ත පාරේ වරිපනම් අංක 85 දරන ඉඩම; දකුණට: කළුආරච්චිගේ කමලාවතී හිමිකම් කියන රබර්වත්ත පාරේ වරිපනම් අංක 85 දරන ඉඩම සහ රබර්වත්ත පාර; බටහිරට: රබර්වත්ත පාර සහ එස්. එස්. ඒ. තිලකසිරි හිමිකම් කියන රබර්වත්ත පාරේ වරිපනම් අංකය සොයාගත නොහැකි ඉඩම.

EOG 07 – 0348

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.